# කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
# නීති පීඨය

## නීතිවේදී උපාධි පරීක්ෂණය, තෙවන වසර - 2022

## අන්තර්ජාතික මානුෂවාදී නීතිය
(පැ තුනයි)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : **06**

**ප්‍රශ්න <u>තුනකට (03)</u> පමණක් පිළිතුරු සපයන්න.**
(නොපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කෙරේ.)

---

01. 'සංග්‍රාමිකයන්ට සන්නද්ධ ගැටුම්වල කුරිරු ස්වභාවය දක්වමින්, අන්තර්ජාතික මානුෂවාදී නීතියට ගරු කිරීමට අසමත් වීම සාධාරණීකරණය කළ නොහැක. ඔවුහු සෑම අවස්ථාවකදීම ඔවුන්ගේ මානුෂීය වගකීම් වෙත අනුකූල විය යුතුය.'

ඉහත ප්‍රකාශය අන්තර්ජාතික මානුෂවාදී නීතියේ ස්වභාවය නිවැරදිව පිළිබිඹු කරයි ද? අදාළ නීතිමය මූලධර්ම, නෛතික අධිකාරීන් සහ ප්‍රායෝගික උදාහරණ සමඟින් ඔබේ පිළිතුරට සහාය දක්වන්න.

02. 'සන්නද්ධ ගැටුමකදී, අන්තර්ජාතික මානුෂවාදී නීතිය ඇතැම් ගැටලු සම්බන්ධයෙන් විශේෂ නීතියක් (*lex specialis*) වන අතර, අන්තර්ජාතික මානව හිමිකම් නීතිය සෙසු කාරණා පිළිබඳව සාමාන්‍ය නීතිය (*lex generalis*) ලෙස සැලකිය හැක. කෙසේ වෙතත්, මෙය බොහෝ දුරට පාරිභාෂිතය (terminology) පිළිබඳ වූ ප්‍රශ්නයකි.'

ඉහත ප්‍රකාශය අනුව, සන්නද්ධ ගැටුමකදී අන්තර්ජාතික මානුෂවාදී නීතිය සහ අන්තර්ජාතික මානව හිමිකම් නීතිය අතර අන්තර්සම්බන්ධය විවේචනාත්මකව ඇගයීමට ලක් කරන්න. අදාළ නෛතික අධිකාරීන් සහ ප්‍රායෝගික උදාහරණ වෙත අවධානය යොමු කරමින් ඔබේ පිළිතුර සනාථ කරන්න.

(අ.පි.බ)

03. දූරා රාජධානිය සහ සූරා මහජන සමූහාණ්ඩුව යනු මාරා කලාපයේ අසල්වැසි රාජ්‍යයන් ද්විත්වයකි. මෙම රාජ්‍යයන් ද්විත්වය දශකයකට වැඩි කාලයක් තිස්සේ සන්නද්ධ ගැටුමක නිරතව සිටී. සටන්කාමී පාර්ශ්ව දෙක අතර යුද ගැටුම් පවතින අතරතුර පහත සිදුවීම් වාර්තා වී ඇත:

අ) දූරා රාජකීය කාලතුවක්කු රෙජිමේන්තුව දේශභූමික සීමාව අසල වූ සූරා භූමියට කාලතුවක්කු ප්‍රහාරයක් එල්ල කළ අතර, එමගින් යුනෙස්කෝව විසින් ලෝක උරුමයක් ලෙස පිළිගත් පුරාවිද්‍යාත්මක ස්ථානයක් විනාශ වී තිබේ. දූරා හමුදාව කියා සිටියේ සූරා හමුදාව විසින් එම ස්ථානයේ කාලතුවක්කු ස්ථානගතකර තිබූ බවයි. සූරා හමුදාව එම චෝදනාව ප්‍රතික්ෂේප කරයි.

ආ) දූරා රාජකීය නාවික හමුදාවේ 'විනීත' නෞකාව මාරා බොක්ක ප්‍රදේශයේ සේවයේ යොදවා ඇති 'රෝහල් නෞකාවකි'. නාවික මෙහෙයුමක යෙදී සිටියදී සූරා නාවික හමුදාවේ 'වෞර' සබ්මැරීනය ටෝපිඩෝ ප්‍රහාරයකින් 'විනීත' නෞකාවට හානි සිදුකරන ලදී. සූරා නාවික හමුදාව ප්‍රකාශ කළේ ඔවුන් එම නෞකාව දූරා රාජකීය නාවික හමුදාවේ ප්‍රහාරක නෞකාවක් ලෙස වැරදි ලෙස හඳුනාගත් බවයි.

ඇ) එක්තරා රාත්‍රියක, දූරා අගනුවර වන 'කාසි' සූරා ගුවන් හමුදාව විසින් දියත් කරන ලද කළාල බෝම්බ ප්‍රහාරයකට (carpet bombardment) ගොදුරු විය. මෙම ප්‍රහාරයෙන් සිවිල් වැසියන් පනස් දෙනෙකුට වැඩි පිරිසක් මිය ගිය අතර සිවිල් නිවාස කිහිපයකට හානි සිදු විය. සූරා හමුදාව කියා සිටියේ ඔවුන්ගේ ඉලක්කය වූයේ අගනුවර පිහිටි දූරා හමුදා මූලස්ථානය බවයි. මෙම ප්‍රහාරයෙන් දූරා හමුදාවේ මෙහෙයුම් සැලසුම් අංශය විනාශ කිරීමට හැකි වූ බව සූරා නිලධාරීහු වැඩිදුරටත් ප්‍රකාශ කරති.

ඈ) දූරා රාජකීය ගුවන් හමුදාව, 'මිනිසුන් රහිත ගුවන් යානාවක්' (Unmanned Aerial Vehicle - UAV) භාවිතා කරමින් සූරා හි පිහිටි න්‍යෂ්ටික බලාගාරයකට ඩ්‍රෝන ගුවන් ප්‍රහාරයක් (drone air strike) දියත් කළේය. මෙම ගුවන් ප්‍රහාරය න්‍යෂ්ටික බලාගාරයට හානි කිරීමට සමත් වූ අතර එමගින් ප්‍රදේශයේ න්‍යෂ්ටික කාන්දුවක් ඇති විය. සූරා බලධාරීන් විසින් වහාම බලාගාරය අසල සිවිල් ගම්මාන දෙකක් ඉවත් කරන ලදී. විකිරණශීලීතාවය හේතුවෙන් සිවිල් වැසියන් පනස් දෙනෙකුට වැඩි පිරිසක් රෝහල් ගත කර ඇත.

(අ.පි.බ)

රාජ්‍යයන් ද්විත්වයම 1949 ජිනීවා සම්මුති සහ 1977 පළමු අතිරේක ප්‍රොටොකෝලය ඇතුළු අදාළ ජාත්‍යන්තර සම්මුතීන්හි පාර්ශ්වකරුවන් යැයි උපකල්පනය කරන්න. අන්තර්ජාතික මානුෂවාදී නීතිය යටතේ රාජ්‍යයන් ද්විත්වයේ වගකීම් සාකච්ඡා කරන්න.

04. සූරායා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය සහ රමායා සමූහාණ්ඩුව සන්නද්ධ ගැටුමක නිරත වී සිටී. මෙම සන්නද්ධ ගැටුම අතරතුර ජාත්‍යන්තර මාධ්‍ය විසින් පහත සඳහන් සිදුවීම් වාර්තා කර ඇත:

අ) සූරායා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ හමුදාව වයස අවුරුදු 15 සිට 18 දක්වා වයස් සීමාවන් හි පසුවන පිරිමි දරුවන් තම හමුදාවේ සැපයුම් ඒකකයක සාමාජිකයන් ලෙස බඳවා ගන්නා ලදී.

ආ) සන්නද්ධ ගැටුම අතරතුර, සිය ගණනක් සූරායා කාන්තාවන්ට රමායා සන්නද්ධ හමුදාවන්හි සොල්දාදුවන් සමඟ 'තාවකාලිකව විවාහ' වීමට බල කෙරී ඇත.

ඇ) අත්අඩංගුවට පත් රමායා සොල්දාදුවන් සූරායා හමුදා විසින් බිම් බෝම්බ ඉවත් කිරීම සඳහා බලහත්කාරයෙන් යොදවන ලදී.

ඈ) අත්පත්කරගත් ක්ෂේත්‍ර රෝහලක ප්‍රතිකාර ලබමින් සිටි තුවාල ලැබූ රමායා සෙබළුන් විසි දෙනෙකු සූරායා හමුදා විසින් ඝාතනය කරන ලදී.

රාජ්‍යයන් ද්විත්වයම 1949 ජිනීවා සම්මුතීන්ට සහ 1977 පළමු අතිරේක ප්‍රොටොකෝලයට පාර්ශ්වකරුවන් වේ. අන්තර්ජාතික මානුෂවාදී නීතිය යටතේ සූරායා සහ රමායා රාජ්‍යයන්ගේ වගකීම් සාකච්ඡා කරන්න. ඔබේ පිළිතුර අදාළ නීති මූලාශ්‍රයන් ඇසුරෙන් තහවුරු කරන්න.

05. මහජන පොලෝසියා ජනරජය සහ කෝසියා එක්සත් ජනපදය ජනවාර්ගික සබඳතා ඇති අසල්වැසි රාජ්‍යයන් වේ. පොලෝසියානුවන් යනු කෝසියා හි සුළුතරය වන අතර පොලෝසියාවේ බහුතර ජනවර්ගය වේ. කෝසියානු බහුතරයේ වාර්ගික වෙනස්කම් හේතුවෙන්, කෝසියාවේ වෙසෙන පොලෝසියානුවන් කෝසියානු බලධාරීන්ට එරෙහිව ගැටුම් කිහිපයක්ම ඇතිකරගන්නා ලදී.

(අ.පි.බ)

පොලෝසියානු බෙදුම්වාදී ව්‍යාපාරය යනු කෝසියා හි වෙසෙන පොලෝසියානු ප්‍රජාව සඳහා ස්වයං පාලනයක් ඉල්ලා සිටින, මනාව සංවිධානය වූ සන්නද්ධ කණ්ඩායමකි. මේ අතර, පොලෝසියානු බෙදුම්වාදී ව්‍යාපාරය විසින් හදිසියේම කෝසියා හි රජයේ වෙබ් අඩවි කිහිපයකට සයිබර් ප්‍රහාරයක් දියත් කරන ලදී. කෝසියා රජය වහාම රාජ්‍ය හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත් කර පොලෝසියානු බෙදුම්වාදී ව්‍යාපාරයේ බොහෝ සාමාජිකයින්ව අත්අඩංගුවට ගැනීමට කටයුතු කරනු ලැබීය. එහි ප්‍රතිඵලයක් ලෙස පොලෝසියානු බෙදුම්වාදී ව්‍යාපාරයේ නායකත්වය කෝසියාවට එරෙහිව යුද්ධ ප්‍රකාශ කළ අතර, පොලෝසියානු දේශසීමාව ආසන්නයේ පිහිටි කෝසියා හි හමුදා කඳවුරු දෙකකට පහර දෙන ලදී.

මෙම ප්‍රහාරය පිටුපස පොලෝසියානු රජය සිටින බවට කෝසියාව චෝදනා කළද, පොලෝසියාව එම චෝදනාව ප්‍රතික්ෂේප කරනු ලැබීය. කෙසේ වෙතත්, දේශසීමාව හරහා භෞමික හමුදා සේනාංක යොදවා කෝසියාව විසින් පොලෝසියා ප්‍රදේශයට ප්‍රහාරයක් දියත් කළේය. පොලෝසියාවේ මායිම් ගම්මානවල ජීවත් වන සිවිල් වැසියන් ආයුධ අතට ගෙන කෝසියානු ආක්‍රමණික හමුදාවන්ට එරෙහිව සටන් කළහ. මෙම ආක්‍රමණයට ප්‍රතිචාර වශයෙන් පොලෝසියාව විසින් කෝසියානු අගනුවරට ගුවන් ප්‍රහාරයක් දියත් කළේය.

අදාළ අන්තර්ජාතික මානුෂවාදී නීති මූලධර්මවලට අනුව ඉහත සිදුවීම් විවේචනාත්මකව ඇගයීමට ලක් කරන්න. රාජ්‍යයන් ද්විත්වයම 1949 ජිනීවා සම්මුතිවලට සහ 1977 පළමු හා දෙවන අතිරේක ප්‍රොටොකෝලයන් හි පාර්ශවකරුවන් යැයි උපකල්පනය කරන්න.

06. <u>අ</u> හෝ <u>ආ</u> වෙත **<u>පමණක්</u>** පිළිතුරු සපයන්න

අ) 'අන්තර්ජාතික මානුෂවාදී නීතිය යනු මානුෂීය හේතූන් මත සන්නද්ධ ගැටුම්වල බලපෑම් සීමා කිරීමට අපේක්ෂා කරන නීති මාලාවකි. අන්තර්ජාතික මානුෂවාදී නීතියට අනුව, ඇතැම් ආයුධ තහනම් කිරීම හෝ ආයුධ භාවිතය පාලනය කිරීම හෝ නිෂ්පාදනය වැළැක්වීම් තුළින් මානව සංහතියට සිදුවන අනවශ්‍ය පීඩාවන් වැළැක්වීම පිළිබඳව සැලකිලිමත් වේ.'

අන්තර්ජාතික මානුෂවාදී නීතිය යටතේ විවිධ වර්ගයේ ආයුධ සඳහා ඇති නීතිමය සීමාවන් සැලකිල්ලට ගනිමින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව ඇගයීමට ලක් කරන්න.

(අ.පි.බ)

ආ) 'මේ සියවසේ අන්තර්ජාතික මානුෂවාදී නීතිය විවිධ මට්ටම්වලින් අභියෝගයට ලක් වී ඇත. අසමමිතික යුද්ධ, සන්නද්ධ ගැටුම් සහ ප්‍රතියුක්ත යුද්ධවලට (Proxy Wars) සම්බන්ධ පාර්ශවයන්ගේ ව්‍යාප්තිය සහ ඛණ්ඩනය අන්තර්ජාතික මානුෂවාදී නීතියේ මූලධර්මවල අදාළත්වය සහ භාවිතය ව්‍යාකූල කරයි.'

ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද? අන්තර්ජාතික මානුෂවාදී නීතිය සම්බන්ධයෙන් සමකාලීන සන්නද්ධ ගැටුම් වෙතින් එල්ල වන අභියෝග විවේචනාත්මකව නිදසුන් ඇසුරින් විමසා බලන්න.

*****